# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 ජූලි මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2021.07.12 දින නිකුත් කරන ලදී)

# මුදල්

**ඇතැම් නීති යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීමට තැනැත්තන්ට ඉඩ ලබාදීම සඳහා ද; එසේ හෙළිදරව් කළ බදු අයකළ හැකි සැපයුම්, අදායම් සහ වත්කම් සම්බන්ධයෙන් බද්දක් පැනවීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ විමර්ශනය කිරීමෙන්, නඩු පැවරීමෙන් සහ දණ්ඩනයන්ගෙන් වන බැඳීම සම්බන්ධයෙන් එකී යම් බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම ස්වේච්ඡාවෙන් හෙළිදරව් කරන තැනැත්තන් වගකීමෙන් මුක්ත කිරීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ දැනටමත් බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ හෙළිදරව් කර ඇති තැනැත්තන් වෙත ඇතැම් සහන ප්‍රදානය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 35.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# මුදල්

එල්. ඩී.— ඕ. 21/2021

**ඇතැම් නීති යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීමට තැනැත්තන්ට ඉඩ ලබාදීම සඳහා ද; එසේ හෙළිදරව් කළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් සම්බන්ධයෙන් බද්දක් පැනවීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ විමර්ශනය කිරීමෙන්, නඩු පැවරීමෙන් සහ දණ්ඩනයන්ගෙන් වන බැඳීම සම්බන්ධයෙන් එකී යම් බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම ස්වේච්ඡාවෙන් හෙළිදරව් කරන තැනැත්තන් වගකීමෙන් මුක්ත කිරීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ දැනටමත් බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ හෙළිදරව් කර ඇති තැනැත්තන් වෙත ඇතැම් සහන ප්‍රදානය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

**ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද පැනවීම**

මේ කොටස අදාළ වන තැනැත්තන්

**2.** (1) (මේ කොටසේ මින්මතු "හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම"යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද බදු අයකළ හැකි සැපයුමෙහි, ආදායමෙහි හෝ වත්කමෙහි යම් ප්‍රමාණයක්, 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බද්දට යටත් කාල සීමාවක් සඳහා එකතු කළ අගය මත බදු වාර්තාවක හෝ 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන ආදායම් බදු වාර්තාවක හෙළිදරව් කර නොමැති යම් තැනැත්තකුට (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ කොටසේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) (අ) හෙළිදරව් නොකළ යම් බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් සම්බන්ධයෙන් II වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ විමර්ශන හෝ විභාග වීමට ඇති නඩු කටයුතු පවතින්නේ යම් තැනැත්තකු සම්බන්ධව ද, එවැනි යම් තැනැත්තකුට;

(ආ) හෙළිදරව් නොකළ යම් බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් සම්බන්ධයෙන් II වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට; හෝ

(ඇ) I වන උපලේඛනයෙහි හෝ IV වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති යම් අදාළ නීතියක විධිවිධාන යටතේ තක්සේරුවක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු විසින් දරනු ලබන හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමක, ආදායමක හෝ වත්කමක යම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද එවැනි යම් ප්‍රමාණයකට,

මේ කොටසේ විධිවිධාන අදාළ නොවන්නේ යඃ

එසේ වුව ද, (ඇ) ඡේදයේ විධිවිධාන, එම ඡේදයේ සඳහන් තක්සේරුව සිදුකිරීමේ දී සැලකිල්ලට ගෙන නොමැති, හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් පිළිබඳ යම් ප්‍රමාණයකට අදාළ නොවන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදයන් හි සඳහන් තැනැත්තකු නොවන, (1) වන උපවගන්තියේ සඳහන් සෑම තැනැත්තකුට ම, මේ කොටසේ මින්මතු "මේ කොටස අදාළ වන තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන්නේ ය.

හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් ආයෝජනය කිරීම හෝ තැන්පත් කිරීම කළ යුතු බව

**3.** (1) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට සමාන මුදල් ප්‍රමාණයක් (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ආයෝජනය කිරීම හෝ තැන්පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින් හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට

සමාන මුදලක් ආයෝජනය කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, ඔහු විසින් -

(අ) එම මුදල් ප්‍රමාණය වහාම ආයෝජනය කිරීමට හැකි අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ එදිනට පසු, නමුත් 2021 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව -

(i) යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද කොටස්;

(ii) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර;

(iii) ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද යම් නිල ලැයිස්තුගත ණය සුරැකුම්පත්; හෝ

(iv) ශ්‍රී ලංකාවේ යම් චංචල හෝ නිශ්චල දේපළක්,

මිල දී ගනු ලැබිය යුතු ය; හෝ

(ආ) එම මුදල් ප්‍රමාණය වහාම ආයෝජනය කිරීමට නොහැකි වන අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ එදිනට පසු වූ නමුත් 2021 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව ඔහු විසින් එම මුදල බැංකු ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව -

(අ) හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට සමාන මුදල් ප්‍රමාණයක් -

(i) යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද කොටස්;

(ii) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර;

(iii) ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද යම් නිල ලැයිස්තුගත ණය සුරැකුම්පත්; හෝ

(iv) යම් චංචල හෝ නිශ්චල දේපළක්,

මිල දී ගැනීම සඳහා යොදවා ඇති; හෝ

(ආ) හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට සමාන මුදල් ප්‍රමාණයක් බැංකු ගිණුමක තැන්පත් කර ඇති,

මේ කොටස අදාළ වන යම් තැනැත්තකුට, (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද

**4.** (1) 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කිරීමට පෙරාතුව, මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, "ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බද්දක් (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ගෙවීමට යටත් වන්නේ ය.

(2) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින් -

(අ) 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයේ, නිශ්චල හෝ චංචල දේපළ හැර හෙළිදරව් නොකළ යම් බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් පිළිබඳ හෙළිදරව් කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක, එම මුදල් ප්‍රමාණයෙන් හෝ ආදායමෙන් හෝ 3 වන වගන්තිය යටතේ වත්කම ආයෝජනය කිරීම හෝ තැන්පත් කිරීම සඳහා වැය කළ මුදල් ප්‍රමාණයෙන් සියයට එකක අනුප්‍රමාණයකින් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවීමට යටත් විය යුතු ය; හෝ

(ආ) 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයේ යම් නිශ්චල හෝ චංචල දේපළක් පිළිබඳ හෙළිදරව් කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක, ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන දිනයේ දී ඒ දේපළෙහි වෙළෙඳ වටිනාකමින් සියයට එකක අනුප්‍රමාණයකින් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවීමට යටත් විය යුතු ය.

(3) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින් ගෙවන ලද යම් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බදු මුදලක්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව බදු බැර මුදලක් හෝ වියදමක් ලෙස සලකනු නොලැබිය යුතු අතර, එය ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම පිළිබඳ හෙළිදරව් කිරීම

**5.** (1) (මේ කොටසේ මින්මතු "ප්‍රකාශ කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් 3 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ආයෝජනය කර ඇති හෝ තැන්පත් කර ඇති සහ ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගෙවා ඇති මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට යටත්ව, මෙහි V වන උපලේඛනයෙහි I වන කොටසේ හෝ II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති අදාළ ආකෘතියට සාරානුකූලව යම් හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමකට, ආදායමකට හෝ වත්කමකට අදාළව ප්‍රකාශයක් 2021 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස්-ජනරාල්වරයා විසින් -

(අ) ප්‍රකාශ කරන්නා විසින් 3 වන සහ 4 වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර ඇති බව ඔප්පු කිරීම සඳහා ප්‍රකාශය සමඟ ගොනු කිරීමට අවශ්‍ය වන ඇමුණුම් ඇත්නම්, එම ඇමුණුම්; සහ

(ආ) ප්‍රකාශය ගොනු කරනු ලබන ආකාරය,

නිශ්චිතව දක්වමින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශයෙන් සෑහීමට පත්වීමෙන් පසුව, කොමසාරිස්-ජනරාල්වරයා විසින්, එම ප්‍රකාශය ලද දින සිට දින තිහක කාලයක් ඇතුළත ලිඛිතව එම ප්‍රකාශය පිළිගනු ලැබිය යුතු අතර, එම පිළිගැනීම, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශය කොමසාරිස්-ජනරාල්වරයා විසින් පිළිගනු ලැබූ බවට වන සාක්ෂියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (අ) කොමසාරිස්-ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශය මේ කොටසේ විධිවිධානවලට අනුකූල නොවන්නේ නම්, ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(ආ) එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ප්‍රකාශ කරන්නා වෙත නොපමාව ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ සිතාමතාම අසත්‍ය හෝ වැරදි තොරතුරු සපයන යම් ප්‍රකාශ කරන්නකු, (3) වන උපවගන්තිය යටතේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් එම ප්‍රකාශය පිළිගනු ලැබීම නොතකා, 6 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද මුක්තියට හිමිකම් නොලබන්නේ ය.

ප්‍රකාශ කරන්නා වෙත ප්‍රදානය කරනු ලබන මුක්තිය

**6.** (1) 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් ප්‍රකාශය පිළිගනු ලැබ ඇති සහ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවනු ලැබ ඇති, යම් ප්‍රකාශ කරන්නකුට -

(අ) 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙරාතුව අවසන් වන යම් කාල සීමාවකට අදාළව සහ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ හෙළිදරව් කළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට අදාළව මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ නීතියේ විධිවිධාන යටතේ;

(ආ) එම ප්‍රකාශ කරන්නා විසින් එකතු කළ අගය මත බද්ද එකතු කර ඇත්නම් මිස, 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශයෙහි හෙළිදරව් කරන ලද බදු අයකළ හැකි සැපයුමක් පිළිබඳ යම් මුදල් ප්‍රමාණයකට අදාළව සහ 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙරාතුව අවසන් වන යම් කාල සීමාවකට අදාළව 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන යටතේ,

යම් බද්දක්, දණ්ඩනයක් හෝ පොලියක් ගෙවීමට ඇති වගකීමෙන් හෝ යම් විමර්ශනයකට හෝ නඩු පැවරීමකට යටත් වීමෙන් සම්පූර්ණ මුක්තිය භුක්ති විඳීමට හිමිකම් ඇත්තේ ය.

(2) 5 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස්-ජනරාල්වරයා විසින්, ඉහත නිශ්චිතව දක්වා ඇති සම්පූර්ණ මුක්තිය (1) වන උපවගන්තියේ සඳහන් යම් ප්‍රකාශ කරන්නකු වෙත ප්‍රදානය කරනු ලබන බවට වගබලා ගත යුතු ය.

**7.** (1) මේ පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශයක අන්තර්ගත යම් කාරණයක් හෝ දෙයක් පිළිබඳව සහ ප්‍රකාශ කරන්නාගේ අනන්‍යතාව පිළිබඳව, කොමසාරිස්-ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් පරම රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබිය යුතු හා ආරක්ෂා කිරීමට සහාය දෙනු ලැබිය යුතු ය. රහස්‍යතාවය

(2) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 100 වන වගන්තිය යටතේ, නිල රහස්‍යභාවය කඩ කිරීම සඳහා දඬුවම් ද ඇතුළුව, නිල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට අදාළව ඒ පනතේ ඇති සියලු විධිවිධාන, මේ පනත යටතේ කරන ප්‍රකාශ සම්බන්ධව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

**8.** මේ කොටස අදාළ වන යම් තැනැත්තෙකු විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, මෙහි I වන උපලේඛනයෙහි හෝ IV වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති අදාළ නීතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට ඔහු යටත් වන්නේ ය. මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැරීම

**9.** සැක දුරු කිරීම සඳහා, 2004 අංක 10 දරන දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනතේ විධිවිධාන යටතේ සිදුකරන ලද යමක් හෝ ප්‍රදානය කරන ලද යම් සමාවක් නොතකා, මේ කොටසේ විධිවිධාන මේ කොටස අදාළ වන යම් තැනැත්තකුට අදාළ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. සැක දුරු කිරීම

II වන කොටස

**ඇතැම් නීති යටතේ හිඟ බදු මුදල් කපා හැරීම සඳහා විධිවිධාන**

**10.** මේ කොටසේ විධිවිධාන, (මේ කොටසේ මින්මතු "බදු ගෙවන්නා"යනුවෙන් සඳහන් කරනු ලබන) 2020 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ 2020 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, I වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ යම් හිඟ බදු මුදල් ගෙවීමට යටත් වන හෝ, මේ කොටස අදාළ වන තැනැත්තන්

එවැනි යම් නීතියක විධිවිධාන යටතේ පනවනු ලබන යම් දණ්ඩනයක් ගෙවීමට යටත් වන යම් තැනැත්තකුට අදාළ විය යුතු ය.

ඇතැම් බදුවලට අදාළ හිඟ බදු මුදල් කපා හරිනු ලැබිය යුතු බව

**11.** මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක හෝ යම් නීතියක යම් විධිවිධානයක හෝ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි හෝ, පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා කොමසාරිස්-ජනරාල්වරයා විසින්, 14 වන සහ 15 වන වගන්තිවලට යටත්ව, යම් බදු ගෙවන්නකු සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙරාතුව අවසන් වන යම් කාලසීමාවකට අදාළව මෙහි III වන උපලේඛනයේ "අ" කොටසෙහි දක්වා ඇති යම් නීතියක් යටතේ වන හෝ මෙහි III වන උපලේඛනයේ "ආ" කොටසෙහි නිශ්චිතව දක්වා ඇති 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ නිශ්චිත විධිවිධාන යටතේ වන යම් හිඟ බදු මුදල් කපා හරිනු ලැබිය යුතු ය.

ඇතැම් පුද්ගලයන්ට අදාළ හිඟ බදු මුදල් කපා හරිනු ලැබිය යුතු බව

**12.** කොමසාරිස්-ජනරාල්වරයා විසින්, 14 වන සහ 15 වන වගන්තිවලට යටත්ව, 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරන ලද තක්සේරු කළ හැකි ආදායම රුපියල් මිලියන තුන නොඉක්මවන යම් පුද්ගලයකු විසින්, 2020 දෙසැම්බර් මස 31 වන දින වන විට 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හැර I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ ගෙවිය යුතු යම් හිඟ බදු මුදලක් කපා හරිනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන පහත දැක්වෙන අවස්ථානුගත කරුණු යටතේ, එවැනි යම් පුද්ගලයකුට අදාළ නොවිය යුතු යඃ-

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව, හිලව් නොකළ පාඩුවක් ඇතුළු යම් පාඩුවක් අඩු කිරීමෙන් තොරව, අදාළ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම රුපියල් මිලියන තුනක් ඉක්මවන අවස්ථාවක දී;

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව, අදාළ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ලැබීම් සහ ලාභ සමඟ එකතු කළ විට රුපියල් මිලියන තුනක් ඉක්මවන අවස්ථාවක දී;

(ඇ) අදාළ පුද්ගලයකු හවුල්කරුවකු වන ව්‍යාපාරයක හෝ හවුල් ව්‍යාපාරයක, 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා වාර්ෂික දළ පිරිවැටුම රුපියල් මිලියන පන්සියයකට නොඅඩු වන අවස්ථාවක දී; හෝ

(ඈ) අදාළ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමට ඔට්ටු ඇල්ලීමේ සහ සූදු ව්‍යාපාරයක් හෝ මත්පැන් සම්බන්ධ යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමෙන් උපයා ගනු ලබන ආදායමක් ඇතුලත් වන නමුත් වෙනත් ව්‍යාපාරයකට හුදෙක් ආනුෂංගික වන්නා වූ එවැනි යම් ආදායමක් ඇතුළත් නොවන්නා වූ අවස්ථාවක දී.

**බදු ගෙවීම පැහැර හැරීම මත වන දණ්ඩන කපා හරිනු ලැබිය යුතු බව**

**13.** (1) කොමසාරිස්-ජනරාල්වරයා විසින්, යම් බදු ගෙවන්නකු විසින් මෙහි I වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ ගෙවිය යුතු බදු මුදලේ ගෙවීමට ඉතිරිව ඇති මුදල 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර පියවනු ලබන්නේ නම් ඒ බදු ගෙවන්නාට අදාළව, 2020 දෙසැම්බර් මස 31 වන දින හෝ එම දිනයට පෙර යම් දිනයක ගෙවිය යුතු වූ එම නීතිවල විධිවිධාන ප්‍රකාරව ගණනය කරන ලද යම් දණ්ඩනයක් හෝ පොළියක් කපා හරිනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන මගින්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හෝ මෙම පනතේ 11 වන හෝ 12 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කපා හරින ලද හිඟ බදු මුදල් සම්බන්ධයෙන් යම් බදු ගෙවන්නකු මත යම් බද්දක්, පොලියක් හෝ දණ්ඩනයක් ගෙවීම සඳහා වගකීමක් ඇති වන බවට කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

**ආරාවුලක් පවතින විට හිඟ බදු මුදල් කපා හරිනු නොලැබිය යුතු බව**

**14.** යම් බදු ගෙවන්නකු සම්බන්ධයෙන් සිදු කරන ලද තක්සේරුවක් මත, මෙහි I වන උපලේඛනයේ හෝ III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් අදාළ නීතියක විධිවිධාන යටතේ, 2021 පෙබරවාරි මස 22 වන දිනට පෙරාතුව, බදු අභියාචනා කොමිෂන් සභාව හෝ යම් අධිකරණයක් ඉදිරියේ තීරණය සඳහා විභාග වෙමින් පවතින, 11 වන හෝ 12 වන වගන්තියේ සඳහන් කරන ලද යම් හිඟ බදු මුදල් සම්බන්ධයෙන් යම් ආරාවුලක් පවතින අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 11 වන හා 12 වන වගන්තියේ විධිවිධාන යටතේ එම හිඟ බදු මුදල් කපා හරිනු නොලැබිය යුතු ය.

**15.** 2020 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව අවසන් වන යම් කාලසීමාවක් සඳහා, මෙහි I වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ, යම් බදු ගෙවන්නකු විසින් යථා පරිදි ඉල්ලා සිටින ලද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ගෙවීමට තිබෙන යම් බදු ආපසු ගෙවීමක් 11 වන හෝ 12 වන වගන්තිවල විධිවිධාන යටතේ කපා හරිනු ලබන යම් හිඟ බදු මුදල්වලට හිලව් කරනු ලැබිය යුතු යඃ

කපා හරින ලද හිඟ බදු මුදල්වලට එරෙහිව බදු ආපසු ගෙවීම් හිලව් කරනු ලැබිය යුතු බව

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන, ආපසු ගෙවීම ලැබිය යුතු කාලසීමාවෙන් පසු යම් කාලසීමාවක් සඳහා නීතිය මගින් පනවනු ලබන යම් දණ්ඩනයක් සම්බන්ධව අදාළ නොවිය යුතු ය.

**16.** (1) කොමසාරිස්-ජනරාල්වරයා විසින්, සෑම බදු ගෙවන්නකු වෙතම, 15 වන වගන්තිය ප්‍රකාරව හිඟ බදු මුදල්වලට හිලව් කරනු ලැබිය යුතු ආපසු ගෙවීමේ මුදල් ප්‍රමාණය, ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

හිඟ බදු මුදල්වලට එරෙහිව හිලව් කරනු ලබන මුදල් ප්‍රමාණ කොමසාරිස්-ජනරාල්වරයා විසින් දැන්විය යුතු බව

(2) එවැනි තැනැත්තකු එසේ කපා හරින ලද හිඟ බදු මුදල්වලට හිලව් කරනු ලැබිය යුතු ආපසු ගෙවීමේ මුදල් ප්‍රමාණ පිළිබඳ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔහු විසින්, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එම දැනුම් දීම සිදුකරන ලද දින සිට දින දාහතරක කාලයක් ඇතුලත, කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද පරිදි හිඟ බදු මුදල්වලට ආපසු ගෙවීම් හිලව් නොකරන ලෙසට ලිඛිත ඉල්ලීමක් කොමසාරිස්-ජනරාල්වරයා වෙත කරනු ලැබිය යුතු අතර, 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර සම්පූර්ණ හිඟ බදු මුදල් ප්‍රමාණය පියවනු ලැබිය යුතු ය.

(3) (අ) කොමසාරිස්-ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ බදු ගෙවන්නකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, (2) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීම සමඟ ඉදිරිපත් කරනු ලබන යම් සුදුසු ගෙවීමේ සැලැස්මකට අනුකූලව 2022 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර (1) වන උපවගන්තියේ සඳහන් හිඟ බදු මුදල් පියවීම සඳහා එම බදු ගෙවන්නා වෙත අනුමතය ලබා දිය හැකි ය.

(ආ) කොමසාරිස්-ජනරාල්වරයා විසින්, එම ගෙවීමේ සැලැස්ම මගින් අනුමත කරන ලද දිනයට හෝ දිනයන්ට පෙරාතුව බදු ගෙවන්නා විසින් (අ) ඡේදය යටතේ අනුමත කරන ලද ගෙවීමේ

සැලැස්මකට අනුකූලව ක්‍රියා කර ඇත්නම්, එම හිඟ බදු මුදල් මත වන යම් පොලී හෝ දණ්ඩන කපා හරිනු ලැබිය යුතු ය.

(4) බදු ගෙවන්නා විසින්, (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් නොකරන අවස්ථාවක දී හෝ කොමසාරිස්-ජනරාල්වරයා විසින් පිළිගනු ලැබූ ගෙවීමේ සැලැස්මට අනුව හිඟ බදු මුදල් නොපියවන අවස්ථාවක දී, කොමසාරිස්-ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ දැනුම් දීම මගින් නිශ්චිතව දක්වන ලද පරිදි හිඟ බදු මුදල්වලට ආපසු ගෙවීම් හිලව් කිරීමට කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

**ඇතැම් නීති යටතේ තක්සේරු නිකුත් නොකළ යුතු ය**

**17.** 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ හෝ 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ විධිවිධාන යටතේ වන යම් තක්සේරුවක්, අදාළ නීතියේ විධිවිධාන යටතේ, 2021 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, යම් බදු ගෙවන්නකු සම්බන්ධයෙන් නිකුත් කරනු නොලැබිය යුතු ය.

**නිසි වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය**

**18.** කොමසාරිස්-ජනරාල්වරයා විසින් 11 වන, 12 වන සහ 13 වන වගන්තිවල විධිවිධාන යටතේ කපා හරින ලද හිඟ බදු මුදල් සහ දණ්ඩන සම්බන්ධව නිසි වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**19.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**අර්ථ නිරූපණය**

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ -

"වත්කම" යන්නට, බැංකු ශේෂයන්, මූල්‍ය සාධන පත්‍ර, කොටස්, ව්‍යුත්පන්න, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු, කාලීන තැන්පතු, බැඳුම්කර හෝ වෙනත් ආකාරවල තැන්පතු, සුරැකුම් හෝ ණය ආකාරයෙන් දෙනු ලබන මුදල්, අතැති මුදල්, මැණික් හෝ රත්රන්, වෙනත් යම් මූල්‍ය අයිතියක් ඇතුළත් වන්නා වූ මුදල් හෝ නිශ්චල දේපළ හෝ චංචල දේපළ අදහස් වන නමුත් යම් අස්පර්ශනීය වත්කමක් බදු ගෙවන්නා විසින් වෙනත් යම් තැනැත්තකුගෙන් මිලදී ගෙන ඇත්නම් මිස ඊට ඇතුළත් නොවේ;

"බැංකු ගිණුම" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක ප්‍රකාශ කරන්නා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන යම් බැංකු ගිණුමක් අදහස් වේ;

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීතිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"නිශ්චල දේපළ" යන්නට, ඉදිකරන ලද හෝ ඉදිකරමින් පවතින ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ඇති යම් ගොඩනැගිල්ලක් ඇතුළත් වේ;

"ආදායම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් ප්‍රභවයකින් උපයනු ලබන යම් ලැබීමක් හෝ ලාභයක් හෝ ලද මුදල් ප්‍රමාණයක් අදහස් වේ;

"පාඩුව"යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 19 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මුදල්" යන්නට, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක රඳවා තබා ගනු ලබන දේශීය ව්‍යවහාර මුදල් සහ විදේශීය ව්‍යවහාර මුදල් ඇතුළත් වේ;

"චංචල දේපළ" යන්නට, රත්රන් ඇතුළුව ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පවතින සියලු ආකාරවල චංචල දේපළ ඇතුළත් වන නමුත් මුදල් ඇතුළත් නොවේ;

"තැනැත්තා" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"වාර්තාව" යන්නෙන්, වාර්තාව සමඟ සැපයීමට නියම කරන ලද යම් සහතිකයක්, ප්‍රකාශනයක් හෝ වෙනත් යම් ඇමුණුමක් ඇතුළුව, I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ නීතිය ප්‍රකාරව යම් තැනැත්තකු හට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගොනු ගත කිරීමට නියම කෙරෙන ආදායම් වාර්තාවක් අදහස් වේ;

"වාසික සමාගම" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 69 වන වගන්තියේ (4) වන උපවගන්තියේ අර්ථානුකූලව යම් සමාගමක් අදහස් වේ;

II වන කොටසේ "බද්ද" යන්නට, I වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ නීතිය යටතේ ගෙවිය යුතු හෝ අය කරනු ලබන යම් බද්දක්, අධිභාරයක්, අය බද්දක්, තීරු බද්දක්, අය කිරීමක් හෝ දායකත්වයක් ඇතුළත් විය යුතු ය;

"බදු අයකළ හැකි සැපයුම" යන්නට, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 83 වන වගන්තිය යටතේ එම යෙදුමට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"හිඟ බදු මුදල්" යන්නෙන්, අදාළ නීතියට අනුකූලව ගෙවිය යුතු දිනයට පසුව ගෙවීම සිදු නොකර පවතින බද්දක් අදහස් වන අතර, එයට කොමසාරිස්-ජනරාල්වරයාගේ වාර්තාවලට අනුව නොගෙවා පවතින, ගෙවීම පැහැර හරින ලද බදු හෝ එවැනි යම් නීතියක් යටතේ පනවනු ලබන වෙනත් දණ්ඩනයක් සහ රඳවා ගැනීමේ බදු හෝ සේවායෝජකයකු විසින් සේවා නියුක්ති ආදායම මත අඩු කරනු ලබන බදු ඇතුලත් වේ;

"බදු අභියාචනා කොමිෂන් සභාව" යන්නෙන්, 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව අදහස් වේ;

"හිලව් නොකළ පාඩු" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 19 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"තක්සේරු වර්ෂය" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## I වන උපලේඛනය

(2,6,8,10,12,13,14 හා 15 වන වගන්ති)

1. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත
2. 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත
3. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
4. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත
5. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

## II වන උපලේඛනය

(2 වන වගන්තිය)

1. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
2. 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත
3. අල්ලස් පනත (26 වන අධිකාරය)
4. 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත

## III වන උපලේඛනය

(10, 11, 14 හා 15 වන වගන්ති)

### අ කොටස

1. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පනවන ලද ධන බද්ද හා ත්‍යාග බද්ද
2. 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත
3. 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත
4. 1989 අංක 8 දරන ධන බදු අධිභාර පනත
5. 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාර පනත
6. 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත
7. 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත
8. 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත
9. 1996 අංක 5 දරන ජාතිය රැකගැනීමේ දායක මුදල් පනත
10. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත
11. 2001 අංක 6 දරන ආදායම් බදු අධිභාර පනත
12. 2002 අංක 16 දරන හරබදු පනත
13. 2005 අංක 5 දරන මුදල් පනත යටතේ පනවන ලද සමාජ වගකීම් බද්ද

14. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත
15. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත
16. 2004 අංක 11 දරන මුදල් පනත යටතේ පනවන ලද ආර්ථික සේවා ගාස්තුව

ආ කොටස

1. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25උ෧ වගන්තිය යටතේ පනවන ලද වෛකල්පිත එකතු කළ අගය මත බද්ද

2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26අ වගන්තිය යටතේ අඩු කරනු ලබන එකතු කළ අගය මත බදු අත්තිකාරම්

IV වන උපලේඛනය

(2,8,10,13 සහ 15 වන වගන්ති)

1. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත
2. 2002 අංක 11 දරන මුදල් පනත
3. 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත
4. 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

V වන උපලේඛනය

I වන කොටස

(5 වන වගන්තිය)

ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද
2021 අංක........දරන මුදල් පනත
5 වන වගන්තිය යටතේ ප්‍රකාශය
පුද්ගලයකු විසින් සපයනු ලැබිය යුතු ය.

ජාතික හැඳුනුම්පත් අංකය: .....................................
ගමන් බලපත්‍ර අංකය: ....................................

1. .................................... (ලිපිනය) යන ලිපිනයෙහි පදිංචි ජා. හැ. අංක/ ගමන් බලපත්‍ර අංක ................................... දරන ................................... (සම්පූර්ණ නම) පූජ්‍ය/ මයා/ මිය/මෙය වන මම, 2021 අංක...............දරන මුදල් පනතේ 1 වන කොටස ප්‍රකාරව බදු අය කළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට අදාළව ප්‍රකාශය සිදු කරමි.

**2.** 2020 මාර්තු 31 වන දින වන විට ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක මා විසින් දරන ලද පහත දැක්වෙන බදු අය කළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම මා මෙයින් ප්‍රකාශ කරමි.

| *අනුක්‍රමික අංකය* | *බදු අය කළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් වර්ගය* | *බදු අය කළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් දැරූ ස්ථානය/ ආයෝජනය කළ අස්ථිත්‍ය/ බැංකුව* | *ප්‍රමාණය/ගිණුම් අංකය* | *මුදල් ප්‍රමාණය /වෙළෙඳපොළ වටිනාකම* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *මුළු මුදල් ප්‍රමාණය /වෙළෙඳපොළ වටිනාකම* | | | |

**3.** ඉහත ප්‍රකාශ කරන ලද මුදල් -

(i) (අ) -------------------- (දිනය) වන දින රුපියල් ------------------ ක මුදල් ප්‍රමාණයක් ------------- (සමාගමේ නම) හි කොටස්/ ණය සුරැකුම්පත් -------------------- (ප්‍රමාණය) ක ආයෝජනය කර ඇත.

(ආ) -------------------- (දිනය) වන දින රුපියල් -----------------ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල/භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇත.

(ඇ) -------------------- (දිනය) වන දින රුපියල්------------------- ක මුදලක් ශ්‍රී ලංකාවේ-------------------- හි (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, රත්රන් ආදිය කරුණාකර සඳහන් කරන්න) ආයෝජනය කර ඇත.

(ii) -------------------- (දිනය) වන දින-------------------- බැංකුවේ-------------------ශාඛාවේ ගිණුම් අංක-------------------- දරන මාගෙ------------------- ගිණුමේ තැන්පත් කර ඇත.

**4.** 2 වන ඡේදයේ සඳහන් කරන ලද සමස්ත මුදල් ප්‍රමාණය/ වෙළෙඳපොළ වටිනාකම මත, 4 වන වගන්තිය ප්‍රකාරව 1% අනු ප්‍රමාණයකින්, යොමු අංක------------------- යටතේ, ---------------------- (මුදල් ගෙවූ දිනය) වන දින, රුපියල්---------------------- ක මුදලක්, දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයාගේ ගිණුම වෙත මා විසින් බදු වශයෙන් ගෙවා ඇත.

**5.** ප්‍රකාශයට පත් කරන ලද බදු අයකළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් ප්‍රමාණය සම්බන්ධයෙන්-

(අ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ, ( 26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ හෝ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන යටතේ කිසිදු විමර්ශනයක් හෝ අධිකරණයක විභාග වෙමින් පවතින නඩු හෝ වරදකට වරදකරු වී නොමැත; හෝ

(ආ) 2021 අංක ---- දරන මුදල් පනතේ I වන උපලේඛනය හෝ IV වන උපලේඛනයේ සඳහන් යම් නීතියක් යටතේ කිසිදු තක්සේරුවක් සිදුකර නොමැත.

මෙහිදී මා විසින් සපයන ලද ඉහත තොරතුරු මාගේ දැනීම සහ විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි වන බවට මම ගාම්භීරතා පූර්වකව ද අවංකව ද ප්‍රකාශ කරමි.

--------------------------

දිනය: ප්‍රකාශ කරන්නාගේ අත්සන

*සටහන:* *මෙම ආකෘති පත්‍රයේ සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී, ප්‍රකාශ කරන්නා විසින් වෙනම කඩදාසියක් භාවිතා කොට එහි අත්සන් කළ යුතු ය.*

(ප්‍රකාශය 2021 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.)

V වන උපලේඛනය

II වන කොටස

(5 වන වගන්තිය)

ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද

2021 අංක........ දරන මුදල් පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

අස්ථිත්‍ය (*සමාගම, හවුල් ව්‍යාපාර, අරමුදල, සමාජය, රාජ්‍ය නොවන සංවිධාන ආදිය) විසින් සපයනු ලැබිය යුතු ය.

බදු ගෙවන්නාගේ හඳුනාගැනීමේ අංකය: --------------------------

අස්ථිත්‍ය වර්ගය : --------------------------

අස්ථිත්‍ය ලියාපදිංචි කිරීමේ අංකය: --------------------------

**1.** ------------------------- (අස්ථිත්‍යයේ නම) හි ----------------------- (තනතුර) වන ------------------------- (ලිපිනය) යන ලිපිනයෙහි පදිංචි ජා. හැ. අංක------------------------- දරන ------------------------- (සම්පූර්ණ නම) මයා/මිය/මෙය වන මම, 2021 අංක ------- දරන මුදල් පනතේ 1 වන කොටස ප්‍රකාරව ඉහත -------------------------(අස්ථිත්‍ය වර්ගය) හි බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට බලයලත් තැනැත්තා වෙමි.

**2.** 2020 මාර්තු මස 31 වන දින වන විට, ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක ------------------------(අස්ථිත්‍යයේ නම) විසින් දරන ලද පහත දැක්වෙන බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම මෙයින් ප්‍රකාශ කරමි.

| *අනුක්‍රමික අංකය* | *බදු අයකළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් වර්ගය* | *බදු අයකළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් දැරූ ස්ථානය/ ආයෝජනය කළ අස්ථිත්‍ය/ බැංකුව* | *ප්‍රමාණය/ගිණුම් අංකය* | *මුදල් ප්‍රමාණය /වෙළෙඳපොළ වටිනාකම* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *මුළු මුදල් ප්‍රමාණය /වෙළෙඳපොළ වටිනාකම* | | | |

**3.** ඉහත ප්‍රකාශ කරන ලද මුදල් -

(i) (අ) ------------------------- (දිනය) වන දින රුපියල් ------------------------ක මුදල් ප්‍රමාණයක් -----------(සමාගමේ නම) හි කොටස්/ ණය සුරැකුම්පත් -----------------------(ප්‍රමාණය) ක ආයෝජනය කර ඇත.

(ආ) ------------------------- (දිනය) වන දින රුපියල් ------------------------- ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල/භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇත.

(ඇ) --------------------- (දිනය) වන දින රුපියල්--------------ක මුදලක් ශ්‍රී ලංකාවේ-------------------------- හි (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, රත්රන් ආදිය කරුණාකර සඳහන් කරන්න) ආයෝජනය කර ඇත.

(ii) ------------------------- (දිනය) වන දින------------------------ බැංකුවේ-------------------------ශාඛාවේ ගිණුම් අංක---------------------- දරන මාගේ-------------------------ගිණුමේ තැන්පත් කර ඇත.

කොමසාරිස්-ජනරාල්වරයාවෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.)



4. *------------------------- වෙනුවෙන්, 2 වන ඡේදයේ සඳහන් කරන ලද සමස්ත මුදල් ප්‍රමාණය/වෙළෙඳපොළ වටිනාකම මත, 4 වන වගන්තිය ප්‍රකාරව 1% අනුප්‍රමාණයකින්, ------------------------- (මුදල් ගෙවූ දිනය) වන දින, යොමු අංක------------------------- යටතේ, රුපියල්-------------------- ක මුදලක්, දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයාගේ ගිණුම වෙත මා විසින් බදු වශයෙන් ගෙවා ඇත.

5. ප්‍රකාශයට පත් කරන ලද බදු අයකළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් ප්‍රමාණය සම්බන්ධයෙන්-

(අ) ------------------(සමාගම, හවුල් ව්‍යාපාර, අරමුදල, සමාජය, රාජ්‍ය නොවන සංවිධාන ආදියේ නම) ට, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනතේ, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ හෝ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන යටතේ කිසිදු විමර්ශනයක් හෝ අධිකරණයක විභාග වෙමින් පවතින නඩු හෝ වරදකට වරදකරු වී නොමැත; හෝ

(ආ) 2021 අංක--------- දරන මුදල් පනතේ I වන උපලේඛනය හෝ IV වන උපලේඛනයේ සඳහන් යම් නීතියක් යටතේ කිසිදු තක්සේරුවක් සිදුකර නොමැත.

මෙහි දී ------------------ (තනතුර) මට්ටමෙන් ------------------ (අස්ථීත්‍යයේ නම) වෙනුවෙන් මා විසින් සපයන ලද ඉහත තොරතුරු මාගේ දැනීම සහ විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි වන බවට මම ගාම්භීරතා පූර්වකව ද අවංකව ද ප්‍රකාශ කරමි.

------------------------------

දිනයඃ සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ/හවුල්කරුගේ අත්සන

*සටහන: මෙම ආකෘති පත්‍රයේ සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී, ප්‍රකාශ කරන්නා විසින් වෙනම කඩදාසියක් භාවිතා කොට එහි අත්සන් කළ යුතු ය.*

(ප්‍රකාශය 2021 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර දේශීය ආදයම් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.)